මගේ අංකය : JSC/SEC/CIR – L/2024

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 10/2024**

සියලුම විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,

<u>**පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි නම් සංශෝධනය කිරීම**</u>

ශීර්ෂගත කාරණය හා සබැඳි, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්ගේ 2024.02.06 දිනැති ලිපිය හා අංක 2365/67 හා 2024 ජනවාරි මස 04 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ - 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ වන නියමය වශයෙන් වූ නිවේදනය, දැනගැනීම සඳහා හා/හෝ අවශ්‍ය කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 මැයි මස 08 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ANNEXE A-

# පුනරුත්ථාපන කාර්යාංශය
# புனர்வாழ்வுப் பணியகம்
# BUREAU OF REHABILITATION

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS


අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கணஹேன, பத்தரமுல்ல.
No: 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | පුනකා/පු/01/01/2024 ( 17 ) | ඔබේ අංකය / உமது இல / Your No | |
| දිනය / திகதி / Date | 2024.02. 06 | | |

09 FEB 2024

බෙදා හැරීම බලන්න.

පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි නම් සංශෝධනය කිරීම.

යොමුව :-

අ. අංක 2365/67 හා 2024 ජනවාරි මස 04 වන දිනැති ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය.(පිටපත අමුණා ඇත)

1. මෙම කාර්යාංශය යටතේ පාලනය වන පහත සඳහන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල නම් 2024.01.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට් පත්‍රයට අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බැව් දන්වා සිටිමි.

| දැනට භාවිතා කරනු ලබන නම | නම සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|
| අ. ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු | සිංහල - නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය<br>ඉංග්‍රීසි - **Navodawa Treatment Centre** |
| ආ. තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | සිංහල - නවෝදාව තෘතීය සහ වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය<br>ඉංග්‍රීසි - **Navodawa Tertiary and Vocational Literacy Training Centre** |

2. ඔබගේ ඉදිරි කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

**ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම් ඒ**
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

**බෙදාහැරීම :-**
1. ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය
2. අගමැති ලේකම් - අගමැති ලේකම් කාර්යාලය
3. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය
4. ලේකම් - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්ක[illegible]ාංශය
5. ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
6. අධිකරණ සේවා කොමිෂන් සභාව - සියලුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීම සඳහා
7. යුද්ධ හමුදා පති - යුද්ධ හමුදා මූලස්ථානය
8. ගුවන් හමුදාපති - ගුවන් හමුදා මූලස්ථානය
9. නාවික හමුදාපති - නාවික හමුදා මූලස්ථානය
10. පොලිස්පති - පොලිස් මූලස්ථානය
11. සභාපති - විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය.
12. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය
13. අධ්‍යක්ෂ ජෙනරාල් - කළමණාකාරණ සේවා දෙපාර්තමේන්තුව
14. සභාපති - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
15. අධ්‍යක්ෂ - සමාජ සේවා දෙපාර්තමේන්තුව


පොදු / பொது / General: +9411 2577457, +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax: +9411 2883737, +9411 2883899
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: bcg.rehabilitation@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.bcgr.gov.lk

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2365/67 - 2024 ජනවාරි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2024.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. -බී. 12/2008

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත

2 වන වගන්තිය යටතේ වන නියමය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් වන මා විසින්, අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ නිර්දේශය මත, මෙම නියමය මගින්, 2014 පෙබරවාරි මස 13 වන දින අංක 1849/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනය, එහි "කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය" යන වචන වෙනුවට, "හලවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ටිරාන් අලස්,
මහජන ආරක්ෂක අමාත්‍ය.

2023 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0046/1




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී. -බී. 12/2008

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත

2 වන වගන්තිය යටතේ වන නියමය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් වන මා විසින්, අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ නිර්දේශය මත, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානය ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථානයක් වශයෙන් නම් කරනු ලැබේ.

ටිරාන් අලස්,
මහජන ආරක්ෂක අමාත්‍ය.

2023 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථානය

නවෝදාව තාතිය සහ වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය

EOG 01 - 0046/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.